Newsletter | පුවත් හසුන | செய்திமடல்

Colombo Public Library Writers-Readers Forum (CPLWRF)

15, Marcus Fernando Mawatha, Colombo 00700; +94 011-269-5156 or +94-71-838-6793

cpl.lending@gmail.com ColomboPublicLibrary.Youtube.com

www.LendingLibraryofColomboPublicLibrary.facebook.com

Volume 5, Issue 1 **June 2021**

About Us | අප ගැන | எங்களை பற்றி

කොළඹ මහජන පුස්තකාලයේ ලේඛක-පාඨක සංසදය (CPLWRF) යනු 'බස්නාහිර පළාත් සභා මහජන පුස්තකාල පාඨක සමාජ' ව්‍යවස්ථානුකූලව හා කොළඹ මහජන පුස්තකාලයට අනුබද්ධව පුස්තකාලයේ හා එහි පාඨකයන්ගේ සංවර්ධනය සඳහා පවත්වාගෙන යන සංසදයකි. සෑම වසරකම ජනවාරි මාසයේ පැවැත්වෙන සංසදයේ වාර්ෂික සමුළුව වලංගු සාමාජික කාඩ් පතක් ඇති සියලු සාමාජිකයන්ට විවෘතයි.

CPLWRF is a forum established according to the guidelines for 'Readers Societies of the Western Provincial Council Public Libraries' for developing the Colombo Public Library and its reader community. The annual general meeting of the forum which is held every January is open to all dues-paying members of the Forum.

மேல்மாகாண சபை, கொழும்பு பொது நூலக வாசகர் ஒன்றியம் என்றால் என்ன என்பதைப் பார்ப்போம். இவ்வொன்றியம் இந்நூலக விதிகளுக்கும், நிபந்தனைகளுக்கும் அமைய, இந்நூலகத்தினை அபிவிருத்தி செய்யவும், வாசகர்களை முன்னேற்றுவதற்கும் தேவையான வேலைகளை முன்னெடுக்க ஏற்படுத்தப்பட்ட ஒரு அமைப்பாகும். அத்துடன் இவ்வான்றியம் ஆனது ஒவ்வொரு வருடமும் ஜனவரி மாதம் கூட்டப்பட்டும் என்பது இவ்வொன்றிய அங்கத்தவர்களுக்கு ஒரு திறந்த அறிவிப்பாகும்

.

අදම සාමාජිකත්වය ලබා ගන්න

කොළඹ මහජන පුස්තකාලය සඳහා වලංගු සාමාජික පතක් ඇති ඕනෑම අයදුම්කරුවකුට රුපියල් 30/- ක ඇතුල්වීමේ ගාස්තුව හා රුපියල් 120/- වාර්ෂික සාමාජික මුදල ප්‍රධාන පුස්තකාලයේ විමසීම් කවුන්ටරයෙන් ගෙවා ලේඛක-පාඨක සංසදයේ සාමාජික කාඩ් පතක් ලබා ගත හැක. සාමාජික ඔබට පුස්තකාලයේ හා පාඨකයන්ගේ ප්‍රගතිය සඳහා සක්‍රියව සහභාගී වීමට හා සංසංදය විසින් පවත්වන සියලුම කටයුතු සඳහා නොමිලේ හෝ සහන මුදලකට සහභාගී විමට හැකිය (පිටු අංක 2 ද බලන්න).

BECOME A MEMBER TODAY

Applicants with an up to date membership at the CMC public library is eligible to become a member of CPLWRF. Pay Rs: 30/- as initiation fee plus Rs: 120/- as the annual fee and receive a membership card today. A membership of the Forum allows you to actively participate in developing the library and its reader community as well get free or subsidized access to all CPLWRF events please see p.2 also)

இன்றே பெற்றுக்கொள்ளும் அங்கத்துவம்

கொழும்பு பொதுநூலகம் தொடர்பாக, இந்நூலக வாசகர் வட்ட ஒன்றியத்தில் அங்கத்துவம் பெற விரும்பும் நூலக அங்கத்தவர்கள், நுழைவுக் கட்டணமாக ரூ.30/- ம், வாசகர் வட்ட ஒன்றிய அங்கத்துவ கட்டணமாக ரூ.120/-ம் செலுத்தி உடனடியாக வருட அங்கத்துவத்தைப் பெற்றுக் கொள்ளலாம். மேலும் இவ் அங்கத்தவர்கள், நூலகம் சம்பந்தமாகவோ அல்லது வாசகர் வட்ட ஒன்றியம் சம்பந்தமாகவோ முன்னெடுக்கப்படும் நூலக அபிவிருத்தி தொடர்பான வேலைகளுக்கு இலவசமாகவோ அல்லது பண உதவி செய்தோ தங்களது பங்களிப்பினை வழங்கலாம்.

EXECUTIVE COMITTEE-2021

President	Mrs. Nandani Gunasekara
Vice President	Mr.K.L.Priyankara
Secretary	Mrs. Lalitha Karunarathne
Treasurer	Mrs. Nishani Medawala
Committee	Mr.Nadesan Pushparaj
	Mrs. Manjula Ranathunga
	Mr. Harsha Samaraweera
	Dr. Indrani Rathnayake
	Mr.Mohommed Iqbal
	Mr. Anuradha Jayathissa
	Mr. K.D.H.Siripala
	Mr. Arjuna Karunanayake

ADVISORS

Chief Librarian	Mrs. Varuni Gangabadaarachchi
Deputy Librarian	Mrs. Chintha Ailapperuma
Librarian 1	Mrs. Thamara Jayasena

ජාත්‍යන්තර වශයෙන් වැදගත් දින මාර්තු / අප්‍රේල්

මාර්තු

- 08 - ජාත්‍යන්තර කාන්තා දිනය
- 15 - ලෝක පාරිභෝගික අයිතිවාසිකම් දිනය
- 22 - ලෝක ජල දිනය
- 23 - ලෝක කාළගුණ දිනය
- 27 - ලෝක නාට්‍ය දිනය

අප්‍රේල්

- 07 - ලෝක සෞඛ්‍ය දිනය
- 12 - ලෝක අභ්‍යවකාශ දිනය
- 22 - ජගත් මිහිතල දිනය

- 23 - ලෝක පොත් දිනය
- 25 - ලෝක මැලේරියා දිනය
- 26 - ලෝක බුද්ධිමය දේපළ දිනය

සංවිධානය කළ වැඩසටහන්

ළමා පුස්තකාලය

- **2021.03.13** වන දින Asia Foundation ආයතනය හා එක්ව දරුවන්ගේ කියවීමේ රුචිය වර්ධනය සඳහාත් විනෝදාස්වාදය සඳහාත් මාර්ගගතව පොත් කියවීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී.



2021.03.26 දින කියවන මුද්දර වැඩසටහනක් මාර්ගගතව පැවැත්වීම. මුද්දරයක් යනු ආකර්ශනීය චිත්‍රයකි. ඒ නිසා දෘශ්‍ය මාධ්‍යයක් උපයෝගී කරගෙන අධ්‍යාපනය ලබාදීමේ සාර්ථක ක්‍රමවේදයක් ලෙස අද ලෝකයේ මුද්දරවලට පිළිගැනීමක් හිමිව තිබේ. මුද්දර අතර එකිනෙකට වෙනස් වූද සමාන වූද කතා තිබේ. මෙම කතාන්තර හඳුනාගැනීම මුද්දර කියවීමයි. එය සාහිත්‍යමය ප්‍රවේශයකි. මේ අනුව මෙම වැඩසටහන මඟින් අලුත් විදිහේ කියවීමක්, අලුත් විදිහේ ඉගෙනීමක් සිදු කිරීමට දුවා දරුවන්ට අවස්ථාව සැලසිණි.

- 2021.04.10 වන දින IBBY(The International Board on Book for Young people) ශ්‍රී ලංකා ශාඛාව හා එක්ව නිර්මාණාත්මක කුසලතා සංවර්ධන වැඩමුළුවක් ළමා අංශයේදී පවත්වන ලදී .

- IBBY ආයතනයේ ශ්‍රී ලංකා සංවිධානය ළමා සාහිත්‍යයේ ගුණාත්මකබව ඔප් නැංවීම පරමාර්ථ කොටගත් සංවිධානයකි. ඔවුන්ගේ මූලික අරමුණ සැබෑ යථාර්තයක් බවට පත් කිරීමට දරන උත්සහය සැබවින්ම අනාගත ළමා පරපුර වෙනුවෙන් සිදුකරනු ලබන වැදගත් ආයෝජනයකි. ළමුන් 57 දෙනෙකුගේ සහභාගිත්වයෙන් මෙම වැඩමුළුව ළමා අංශයේදී පවත්වන ලදී.

- 2020 සාහිත්‍ය තරඟ සඳහා ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය ද ප්‍රධාන පුස්තකාලයාධිපතිතුමිය හා නියෝජ්‍ය පුස්තකාලයාධිපතිතුමියගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදී.

බැහැරදෙන පුස්තකාලය

- 2021/03/08 වන දින ලෝක කාන්තා දිනයට සමගාමීව 2021.03.10 දින පෙ.ව. 9.30 ට "සාරි ජැකට්" පතරොමක් සැකසීමේ වැඩමුළුවක් පැවැත්වීම. මේ සඳහා සම්පත් දායකත්වය බැහැරදෙන අංශයේ සේවයේ නියුතු පුස්තකාල සහකාර ප්‍රදීපා ප්‍රියංගනී මහත්මිය විසින් ලබාදෙන ලදී.

- 2021.03.20 දින ප්‍රවීණ ලේඛක මංජුල සේනාරත්නයන්ගේ 12.12.12 කෘතිය පිළිබඳ විචරණයක් 47 දෙනෙකුගේ සහභාගිත්වයෙන් Zoom අවකාශය ඔස්සේ පැවැත්වීම. මේ සඳහා මංජුල සේනාරත්න මහතා ප්‍රංශයේ පැරිස් නුවර සිට අප හා සම්බන්ධ විය.





මංජුල සේනාරත්න විසින් රචිත 12.12.12 කෘතිය ලාංකිය පාඨකයාට වෙනස්ම අත්දැකීමක් එක් කළ කෘතියකි. මෑත කාලීනව බිහිවූ විශිෂ්ට ත්‍රාසජනක රහස් පරික්ෂක කතාවක් අඩංගු කෘතියක් ලෙස මෙම කෘතිය හැඳින්විය හැකිය. කතුවරයා සියුම් සිදුවීමක් ඉතා අලංකාරවත් ලෙස ප්‍රති නිර්මාණය කිරිමට සමත්කම් දක්වා ඇත. එම නිසාවෙන්ම එම කෘතියට විශාල පාඨක ආකර්ෂණයක් ද ලැබි ඇත.

මෙහි එන කතා තේමාව අප සමාජය තුළ ද බහුල වශයෙන්ම දක්නට ඇති කතා තේමාවකි. ඒ පිළිබඳ මෙරට පුවත්පත් සිරස්තල හා ප්‍රවෘත්ති මනා ලෙස සාධක සපයනු ඇත.

මෙම කෘතිය තුළ එක් පරිච්ඡේදයක් අවසන් වී අනෙක් පරිච්ඡේදයේ නැවුම් ආරම්භය පාඨකයා කතාව කෙරෙහි ඇද බැඳ තබා ගැනිමට සමත්කම් දක්වා ඇත. එම නිසාවෙන්ම පිටු 420ක් වැඩි වෙහෙසක් නොගෙන කියවිමේ අවස්ථාව පාඨකයාට ලැබි ඇත. කතුවරයා චරිත අතර යොදා ගන්නා සරල සංවාදයන්ද කතවට එක් කරන්නේ නැවුම් රසකි.

විදේශිය රටක සිදුවු රහස් පරික්ෂණයක් මේ තරම් දේශිය පාඨකයාට සමිප කරවිමට කතුවරයා ගත් උත්සහාය සියයට දේසියක් සාර්ථක වි ඇත. ඊට මුලිකම හේතුව වන්නේ ඔහු විසින් භාවිතා කරන ලද සරල භාෂා භාවිතය යැයි මට සිතේ. ත්‍රාසය රැගත් මෙම රහස් පරික්ෂක කෘතිය කියවන්නට ඔබටත් ආරාධනා කරමි.

ඔබටත් එය වෙනස්ම රස වින්දනයක් එක් කරනු නොඅනුමානය.

- 2021.04.24 දින ප.ව.2.30 ට පුස්තකාල ශ්‍රවණාගාරයේදී ප්‍රවීණ ලේඛක සුගත් ශාන්ත මොරාගහකුඹුර මහතාගේ "මයෙ අප්පච්චි කෘතිය" පිළිබඳ විචරණයක් එතුමාගේ සහභාගිත්වයෙන් පැවැත්වීය

- ජාත්‍යන්තර කාන්තා දිනය මාර්තු 08 වන දිනට යෙදී ඇත. මෙවර 2021 කාන්තා දින තේමාව වූයේ “නායකත්වයේ කාන්තාවන්- Covid-19 ලෝකයක සමාන අනාගතයක් අත්කර ගැනීමයි”. ලෝකයේ ජීවනාලිය කාන්තාවයි. ලොවට හැඩයක් දෙන්නී ලොව සුන්දර කරන්නී කාන්තාවයි. ඇය නොමැතිව ලොවෙහි ජීවයක්ද නොපවතී.

- කාන්තා දිනයට සමගාමීව බැහැරදෙන අංශය තුළ කාන්තාව පිළිබඳ රචිත ග්‍රන්ථ එකතුවක් හා “සූපශාස්ත්‍ර” ග්‍රන්ථ එකතුවක් ප්‍රදර්ශනය කරන ලදී.

- 2021 අප්‍රේල් මස යෙදුණු සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ පොත් එකතුවක් ප්‍රදර්ශනය කිරීම.

- අප්‍රේල් 22 ලෝක මිහිතල දිනයයි. මෙය ලොව විශාලතම ප්‍රජා සැමරුම් දිනය වේ. මෙම වසරේ තේමාව අපේ පෘථිවිය යථා තත්වයට පත්කිරීම (Restore our Earth) වන අතර එහි අවධානය යොමු වී ඇත්තේ ස්වභාවික ක්‍රියාවලින් නැගී එන හරිත තාක්ෂණයන්සහ ලෝකයේ පරිසර පද්ධති යථා තත්වයට පත් කළ හැකි නව්‍ය චින්තනය.

- ජාත්‍යන්තර “මිහිකත දිනය” තේමා කොට ඒ පිළිබඳ විශේෂ ග්‍රන්ථ එකතුවක් බැහැරදෙන අංශය තුළ ප්‍රදර්ශනය කරන ලදී.

New Acquisitions of Lending Library
(English fictions)



ශාඛා පුස්තකාලවල සිදුකරන ලද විශේෂිත වැඩසටහන්

බෙල්මන්ට් ශාඛා පුස්තකාලය

- 2021 වර්ෂයේ මාර්තු 08 දිනට යෙදී තිබූ ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් 2021.03.13 වන දින සුපවේදී වැඩසටහනක් පුස්තකාල පරිශ්‍රයේදී පවත්වන ලදී. පෙ.ව. 10.00 ට ආරම්භ කරන ලද මෙම වැඩසටහන සඳහා කාන්තාවන් 20 ක් වැනි සීමිත පිරිසක් සහභාගී කර ගන්නා ලදී. ශාඛා අධීක්ෂණ පුස්තකාලයාධිපති මෙම වැඩසටහනට සහභාගී වූ අතර ප.ව. 1.00 පමණ වැඩසටහන නිමාවට පත්විය.

- කොළඹ 12 අල් හකීම් විද්‍යාලයේ දරුවන් තිස් දෙනෙක් සඳහා පහ වසර ශිෂ්‍යත්ව වැඩපොත් බෙදාදීමේ වැඩසටහනක් 2021.04.08 දින පවත්වන ලදී.

- බෝනමෝතා පෙරපාසල සමග අලුත් අවුරුදු වැඩසටහනක් 2021.04.09 දින පවත්වන ලදී.

- 2021.04.22 යෙදුනු මිහිතල දිනය නිමිත්තෙන් බෙල්මන්ට් පුස්තකාල පරිශ්‍රයේදී රුක් රෝපණයක් සිදු කරන ලදී.

සීවලී ශාඛා පුස්තකාලය

- ජාත්‍යන්තර කාන්තා දිනය සහ සිංහල අලුත් අවුරුද්ද වෙනුවෙන් ගෘහණියන්ට නිවැරදිව සිංහල රසකැවිලි (කොණ්ඩ කැවුම් සහ පැණි වළලු) සාදාගන්නා ආකාරය පිළිබඳ වැඩසටහනක් 2021.03.20 වන දින ප.ව.1.30 ට පුස්තකාල පරිශ්‍රයේදී පවත්වන ලදී.

මට්ටක්කුලිය ශාඛා පුස්තකාලය

- කාන්තා දිනය නිමිත්තෙන් ප්‍රදේශයේ ස්වයංරැකියාලාභීන් ඇගයීම හා ඔවුන්ගේ නිෂ්පාදන හඳුන්වාදීම හා එම නිෂ්පාදනවලට නව වෙළඳපොලක් නිර්මාණය කරදීමේ අරමුණින් 2021 මාර්තු මස 09 වන දින ස්වයං රැකියා වැඩමුළුවක් සිදු කරන ලදී.

- සිංහල අලුත් අවුරුදු උත්සවය නිමිත්තෙන් 2021.04.08 වන දින ප්‍රධාන පුස්තකාලයාධිපතිතුමියගේ හා නියෝජ්‍ය ප්‍රධාන පුස්තකාලයාධිපතිතුමියගේ ප්‍රධානත්වයෙන් සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර හඳුන්වාදීම හා රඟ දැක්වීමේ වැඩසටහනක් පැවැත්වීම.

කොටහේන ශාඛා පුස්තකාලය

- 2021.03.08 වන දින ප.ව.1.30 සිට ප.ව.3.30 දක්වා කාන්තාවන් සඳහා ගෙවත්තක තිබිය යුතු පැළෑටි වර්ග හඳුන්වා දී එහි අගයන් පිළිබඳ දැනුවත් කිරීමක් සිදු කරන ලදී. මේ සඳහා කාන්තාවන් 15 දෙනෙකු සහභාගී විය.

- ළමා අංශය සඳහා පුවත්පත් කැපුම් එකතුවක් සංවිධානය කිරීම.

- පාඨකයින්හට 2021.04.01 වන දින සිට පොත් සමාලෝචන (book review) pdf අයුරින් යැවීම සිදු කරන ලදී.

සුචරිත පුස්තකාලය

- 2021.03.09 දින ප.ව. 2.30 ට ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් "කාන්තා අභිවෘද්ධියට ධනාත්මක චින්තනයක්" යන තේමාව යටතේ හරවත් දේශනයක් හා මාතෘකාවට අදාළව ගායනයක් ද ඇතුලුව අධිකරණ අමාත්‍යාංශයේ සමථ නිලධාරිනී සුමිත්‍රා සිරිමාන්න මහත්මිය විසින් පවත්වන ලදී. මේ සඳහා මාර්ගගතව 15 දෙනෙකු හා සජීවීව 13 දෙනෙකු සම්බන්ධ විය.

කිරුළපන ශාඛා පුස්තකාලය

- 2021.03.30 දින දේශක කීර්ති මුණසිංහ මහතා විසින් ප.ව. 2.30 සිට ප.ව.3.30 දක්වා කාලය තුළ කියවීම තුළින් අභියෝග ජයගත හැකිය යන මාතෘකාව යටතේ Teams App හරහා Online මගින් වැඩසටහනක් ඉදිරිපත් කරන ලදී. මේ සඳහා පාඨකයින් 15 දෙනෙකු සහභාගී විය.

බොනවිස්ටා ශාඛා පුස්තකාලය

- 2021.03.19 වන දින කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මගින් ස්වයං රැකියා වැඩසටහනක් පවත්වන ලදී. ඒ සඳහා කාන්තාවන් 50 දෙනෙකු සහභාගි විය.

- ජාතික පුස්තකාලය හා වෘත්තීය පුහුණු අධිකාරිය එක්ව පොදු රාජ්‍ය මණ්ඩලයීය ශිෂ්‍යත්ව වැඩසටහන පිළිබඳව පාඨකයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2021.03.19 දින පවත්වන ලදී. එම ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ කුසලතා සංවර්ධනයට අවශ්‍ය පාඨමාලා රාශියක් නොමිලේ හැදෑරීමට අවස්ථාව සලසා දී ඇත.

බෙත්තාරාම ශාඛා පුස්තකාලය

- 2021.04.03 දින පෙ.ව. 10.00 ට පුස්තකාලයේ රැස්වීම් ශාලාවේදී සිංහල අවුරුදු චාරිත්‍ර ඉටු කිරීම. මෙහිදි වැඩ ඇල්ලීම, කිරි ඉතිරවීම, ගනුදෙනු කිරීම, ආහාර අනුභවය සංකේතාත්මකව ඉටු කිරීම. මේ සඳහා නියෝජ්‍ය පුස්තකාලයාධිපතිතුමිය හා අධීක්ෂණ නිලධාරීතුමා ඇතුළු පාඨකයන් 26 දෙනෙකු සහභාගි විය.

ශ්‍රී ලංකාව සහ මාර්ගගත අධ්‍යාපනය

ඉගෙනීම, නම්‍යශීලී, උපදේශාත්මක දැනුම බෙදාහැරීමක් මෙන්ම ඉගෙනීමේදී ගුරුවරුන් හා සිසුන් වෙන්ව ආරක්ෂාකාරීව අධ්‍යාපනය ලැබීමේ ක්‍රමයක් ලෙසද මාර්ගගත අධ්‍යාපනය හැඳින්විය හැකිය. මෙම ඉගෙනුම් ක්‍රමය පරිගණක සාක්ෂරතාවය වැඩි දියුණු කිරීමට ද බෙහොසෙයින් ඉවහල්වේ. දූවා දරුවන්ගේ හා වැඩිහිටියන්ගේ දැනුම වර්ධනය මෙන්ම තමන් සතු කුසලතා ලෝකයා ඉදිරියේ ප්‍රකාශ කිරීමටද මෙමගින් හැකියාව ඇත.

කොරෝනා වෛරසය හේතුවෙන් අද වන විට ලෝකයේ ආර්ථික, සමාජීය, දේශපාලනික කටයුතු සහ සමාජ සබඳතා අකර්මන්‍ය වී ඇති අතර අධ්‍යාපනයේ ද පසුබෑමක් දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ උද්ගත ව ඇති තත්ත්වය ද එතරම් සතුටුදායක නොවේ. මේ සඳහා හොඳම විකල්පය වන්නේ මාර්ගගත අධ්‍යාපනයක් කරා යොමුවීමයි.

සාම්ප්‍රදායික අධ්‍යාපනය හා සසඳන විට වර්තමානයේදී ඉතා වැදගත් වාසි රැසක් Online අධ්‍යාපනය ඔස්සේ ලබා ගත හැක.

මෙම අධ්‍යාපන පාඨමාලා සඳහා ස්ථාවර කාලයක් නොමැත.පාඩම් මග හැරේ යැයි, එම පාඩම සම්බන්ධ තොරතුරු නැති වේ යැයි බියෙන් තොරව සිසුන්ට ඔවුන්ගේ කටයුතුවල නිරත වී කාලය ලැබුණු සැනින් පාඩම්වලට සම්බන්ධ වී දැනුම පුළුල් කර ගත හැක.කාල කළමනාකරණය පිළිබඳව සැලකීමේදී අධ්‍යන කටයුතු සඳහා වඩාත් වැඩි කාලයක් මෙම ක්‍රමය හරහා ලබා ගත හැක.මෙය මඟින් අධ්‍යාපනයේ නව විප්ලවීය වෙනසක් මේ වන විටද ඇති කර අවසන්ය.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ ශිෂ්‍යයන් සාර්ථකත්වය කරා යන්නේ බොහෝ විට ටියුෂන් සම්ප්‍රදායේ ඇති බලපෑමක් ඇති බව නොරහසකි. එහෙත් මේ වන විට රට තුළ පාසල් සහ ටියුෂන් ආයතන වසාදමා තිබීම හේතුවෙන්, පාසලටත් ටියුෂන් පංතියටත් සීමා ව, මානසික ව සිරගත වී සිටි දරුවා නිදහස් නිවහල් සමාජයක ජීවත් වේ. ගුරුවරයා විසින් දැනුම අඹරා පෙවීමට උත්සුක වන සංකල්පවලින් මඳකට ඈත්මැත් ව ස්වෝත්සාහයෙන් සහ චුවමනාවෙන් ලෝකයේ ඇති නියම දැනුම සොයාගෙන යා හැකි තැනට අද වන විට දරුවා පත් ව සිටීම සතුටට කරුණකි. මේ වන විට සමාජය, මාපියන් සහ සොබාදහම සමඟ ගැටෙන දරුවා දැනුමට එහා ගිය බුද්ධියක් ලැබිය හැකි තත්ත්වයකට ද පැමිණ ඇත.

(තොරතුරු අන්තර්ජාලය ඇසුරෙන්)

New Arrivals

Non-Fictions









Fictions











Translations